# හැටන්- දික්ඔය නගර සභාව

# නුවරඑළිය දිස්ත්‍රික්කය

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව2015 ජූලි 06 දින ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හැටන් - දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණ.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුල පළාත් පාලන සතිය වෙනුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ට්‍රැක්ටර් රථයේ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 10,074,860 ක් වූ අතර ඒ තුළ අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි වටිනාකම රු.5,319,596ක් වී තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 42,018,971ක් වූ අතර ඒ තුළ අවුරුදු 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි වටිනාකම රු.28,992,296ක් වී තිබුණි.

1.3. 5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු.32,669,345ක් වටිනා ගිණුම් විෂයයන් 05ක් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකිවිය.

1.3.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

--------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 371 (2) | 1987 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අවස්ථා 94කදී ලබාගත් රු.5,507,610ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වෙනි පරිච්ඡේදයේ 1:6 හා 04 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයනොවී පවතින රු39,727ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 46 දරන චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 2006 වර්ෂයෙන් පසු තක්සේරු කර බදු මුදල් ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,765,173ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,604,958ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.8,160,215ක වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 07ක ආදායම සියයට 05 සිට සියයට 532ක පරාසයකින් වැඩිවීමත් වියදම් විෂයයන් 05ක වියදම සියයට 12 සිට සියයට 78 දක්වා වූ පරාසයකින් අඩුවීමත් හේතු වී තිබුණි.

2.3. ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2014.01.01 දිනට හිඟය | 2014.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2014.12.31 දිනට හිඟ: 2014.01.01 දිනට පැවති හිඟයෙන් | 2014.12.31 දිනට හිඟ: වර්ෂයේ බිල්කිරීම් වලින් | 2014.12.31 දිනට හිඟ: මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 3,655,500 | 2,210,401 | 7,248,678 | 6,077,350 | 1,445,099 | 1,171,328 | 2,616,427 |
| බදු කුලී | 6,119,579 | 4,477,107 | 11,114,434 | 8,826,091 | 1,642,470 | 2,288,347 | 3,930,817 |
| බලපත්‍ර ගාස්තු | 220,838 | 220,712 | 2,061,239 | 1,968,885 | 126 | 92,353 | 92,479 |

### 2.3.2 බදු කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලයට අදාළව හිඟ මස්කඩ කුලී ආදායම රු.555,420ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ). හැටන් නව වෙළඳපල ඉදිරිපිට ඇති මාළු වෙළඳකුටි 06 කින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.172,350ක් අයවියයුතුව තිබුණු අතර ඉන් වෙළඳකුටි 05ක් සඳහාම 2014 වසර තුල කිසිදු මුදලක් ගෙවා නොතිබුණ ද හිඟ මුදල් අයකරගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු දික්ඔය එම්.ඒ.එස්.අබුසාලි ශාලාව බදු දීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.525,272ක මුදලක් අයවිය යුතු වුවත්, එම මුදල් අයකරගැනීම සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) විධිමත් ප්‍රසම්පාදන පරිපාටියට පටහැනිව හැටන් වෙළඳපොළ අංක 13 දරන ගව මස්කඩය බදුදීම හේතුවෙන් අගතියට පත් ටෙන්ඩර්කරු විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. ඒ අනුව රු.100,000 ක නීතිඥ ගාස්තුවක් දැරීමට සිදුවී තිබූ අතර රු.931,000ක කුලී ආදායමක් 2014 වර්ෂ තුලදී සභාවට අහිමිවී තිබුණි.

(ඉ) සභාවට අයත් හැටන් තරු චතුරස්‍රයේ කඩකාමර 08ක්, එක් කාමරයක් සඳහා රු.7,500ක් ලෙස 2014 පෙබරවාරි 05 දිනවන විට තක්සේරුකර තිබියදී මසකට රු.1,500 බැගින් අයකරමින් පැවතුණි.ඒ අනුව 2014 වර්ෂය තුල රු.66,000 ක මූල්‍ය පාඩුවක් සිදුව තිබුණි

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 224,750 |
| මුද්දර ගාස්තු | 3,474,251 |

2.3.4 වරිපනම් බදු

වරිපනම් බදු අයකරනු ලබන වෙළඳසැල් 375හි අගය කාලීනව තක්සේරු කර නොතිබීමෙන් සභාවට අයවිය යුතු විශාල ආදායමක් අහිමිවී තිබුණි.

2.4 අධිභාර

නගර සභා ආඥාපනතේ 255වන අධිකාරය 182(1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාරවල අගය රු. 29,692ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය ඇගයීම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු බදු දී ඇති ඉඩම්, වර්ෂ 05කට වරක් හෝ තක්සේරු කර බදු මුදල් ප්‍රතිශෝධනය කිරීමටද කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) හැටන් තානායමට අදාලව,මාසික තානායම් කලමනාකරණ ගාස්තු වශයෙන් අයවියයුතු රු.736,736ක මුදල අයකරගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 පාරිසරික බලපත්‍ර ගාස්තු
----------------------------
1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය යටතේ හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ව්‍යාපාර සඳහා බලපත්‍ර නිකුත්කර නොතිබුණි. 2014 සැප්තැම්බර් 18 දින කරන ලද පරීක්ෂණය අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු වෙලඳ ව්‍යාපාර 34 කට පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට අහිමිවී ඇති ආදායම 165,600ක් විය.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------
4.1 අයවැය පාලනය
------------------
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06ක සියයට 13 සිට සියයට 278 දක්වාද වියදම් විෂයයන් 04 ක සියයට 12 සිට සියයට 95 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්
--------------------------------------------------------
2013 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 12කට පිළිතුරු සපයා නොතිබුණි.

4.3 වාර්ෂික ප්රසම්පාදන සැලැස්ම
--------------------------------
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 පරිච්ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය
-----------------------
ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අභ්‍යන්තර පාලනය.

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). ණයගැති ණයහිමි පාලනය.

(ඈ). වත්කම් කළමනාකරණය